මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2016

Primary Piriven Year End Term Test - 2016

3 වසර / Grade 3

සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

සාමාන්‍ය විද්‍යාව
**General Science**

කාලය : පැය තුනයි
Time : Three hours

## I කොටස

- **මෙම කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01) දී ඇති පිළිතුරු වලින් තෝරාගෙන හිස්තැන් පුරවන්න.

1. ජීවීන්ගේ ශ්වසනය සඳහා දේහයට ලබාගන්නේ ....................................... වායුවයි, අප අවට වාතයේ වැඩිපුරම ඇති වායුව ....................................... වන අතර ශ්වසනයේ ප්‍රතිඵලයක් ලෙස ජීවීන් වායුගෝලයට පිට කරන්නේ ....................................... ය. දහනය සඳහා වැයවෙන්නේ ....................................... වායුවයි.

(නයිට්‍රජන්, කාබන්ඩයොක්සයිඩ්, ඔක්සිජන්)

2. මල් ගස ⟶ සමනලයා ⟶ කුරා

මෙහි දැක්වෙන්නේ ආහාර දාමයකි.

ආහාර දාමයක මුල් පුරුක ....................................... ක් වන අතර අවසන් පුරුක බොහෝ විට ....................................... යෙකි. පරිසර පද්ධතියක තනි තනි ආහාර දාම වෙනුවට පවතින්නේ ....................................... යි. වනාන්තරයක වැඩියෙන්ම දැකිය හැකි සත්ව වර්ගය වන්නේ ....................................... යන්ය.

(ශාක භක්ෂක, ආහාර ජාල, ශාකය, මාංශ භක්ෂක)

3. රාශි චක්‍රයට අයත් තරුරටා ගණන .................................. කි. මෙමගින් අපට පෙනෙන දීප්තිමත්ම තරුව පිහිටි තරුරටාව .................................. තරු රටාවයි. උතුරු දිශාව හඳුනා ගැනීමට භාවිතා වන ධ්‍රැව තාරකාව පිහිටා ඇත්තේ .................................. තරු පන්තියේය. හත්දින්න තරු පොකුරෙහි පියවි ඇසට පෙනෙන උපරිම තරු ගණන .................................. කි.

(12, 9, කුඩා වලසා, ඔරායන්)

4. ශාක වර්ගීකරණයේදී පුෂ්ප හට ගන්නා ශාක .................................. ශාක ලෙසද, පුෂ්ප හට නොගන්නා ශාක .................................. ශාක ලෙසද හැඳින්වේ. සත්ව වර්ගීකරණයේදී කොඳු ඇට පේලියක් සහිත සතුන් .................................. ලෙසද කොඳු ඇට පේලියක් නොමැති සතුන් .................................. ලෙසද නම් කෙරේ.

(පෘෂ්ඨවංශීන්, අපුෂ්පක ශාක, සපුෂ්පක ශාක, අපෘෂ්ඨවංශීන්)

5. ගිනි ගොඩක් අසල සිටින මිනිසෙකුට තාපය ලැබෙන්නේ ................................. ක්‍රමයෙන් වන අතර ගිනි ගොඩට ඉහලින් තිබෙන ගසක පත්‍රවලට එම තාපය ලැබෙන්නේ ................................. ක්‍රමයෙනි. ගිනි ගොඩට එක් කෙලවරක් වැටී තිබූ කම්බියක් අනෙක් කෙලවරෙන් ඇල්ලූවිට රත් වී තිබෙන්නේ එය තුලින් ................................. ක්‍රමයෙන් තාපය ගමන් කිරීම නිසාය. මේ අතර රික්තකයක් තුළින්ද තාපය ගලා යන්නේ ................................. මගිනි.

**(සංවහනය, සන්නයනය, විකිරණය)**

6. ලෝහයක ඝනත්වය සාපේක්ෂව ................................. යන අතර අලෝහයක ................................. සාපේක්ෂව පහළ යයි. හොඳ විද්‍යුත් හා තාප සන්නායක ලෙස ................................. භාවිතා කරන අතර ................................. දුර්වල විද්‍යුත් හා තාප සන්නායක වේ.

**(අලෝහ, ලෝහ, ඉහල, ද්‍රවාංක)**

7. පෘථිවිය පැතලි ස්වරූපයක් ගන්නා බව ප්‍රකාශ කල ග්‍රීක දාර්ශනිකයා ................................. වේ. පෘථිවිය ගෝලාකාර බව මුලින්ම ප්‍රකාශ කලේ ................................. විසිනි. ................................. විසින් සූර්ය කේන්ද්‍රීය ආකෘතිය ඉදිරිපත් කරන ලදි. තාරකා පිළිබඳ අධ්‍යයනය සඳහා උපකරණ ගණනාවක් මුල් වරට නිර්මාණය කරන ලද්දේ ................................. විසිනි.

**(පයිතගරස්, තෙලෙස්, ටයිකෝ බ්‍රාහේ, ඇරිස්ටාකස්)**

8. ඵල හා බීජ ව්‍යාප්තිය සැලකූ විට කපු යනු ................................. මගින් ව්‍යාප්ත වන බීජයකි. ගම්මාලු ................................. මගින් ව්‍යාප්ත වන බීජයකි. පුවක් යනු ................................. මගින් ව්‍යාප්ත වන බීජයක් වන අතර රබර් යනු ................................. මගින් ව්‍යාප්ත වන බීජයකි.

**(සුළඟ, ජලය, ස්පෝටනය, සතුන්)**

9. සාමාන්‍යයෙන් පුෂ්පයක කැපී පෙනෙන වර්ණවත් කොටස ................................. වේ. ලපටි පුෂ්පය ආරක්ෂා කරන වලයාකාර කොටස ................................. ලෙස හැඳින්වේ. පුෂ්පයක පුරුෂ ප්‍රජනක ව්‍යූහය ................................. වන අතර ස්ත්‍රී ප්‍රජනක ව්‍යූහය ................................. වේ.

**(මණිය, මුකුටය, ඡායාංගය, පූමාංගය)**

10. සම්පූර්ණ රූපාන්තරණය පෙන්වන සතුන්ගේ ජීවන චක්‍රය අවස්ථා ................................. කි. අර්ධ රූපාන්තරණයක් පෙන්වන සතුන්ගේ ජීවන චක්‍රය අවස්ථා ................................. කි. ................................. සම්පූර්ණ රූපාන්තරණයක් පෙන්වන සතෙක් වන අතර ................................. අර්ධ රූපාන්තරණයක් පෙන්වන සතෙකි.

**( 3 , 4 , සමනලයා , කැරපොත්තා )**

*(ලකුණු 4×10 = 40)*

## II කොටස

02) මෙම කොටසින් ප්‍රශ්න හතරකට පමණක් පිලිතුරු සපයන්න.




*I රූපය*

මෙහි දැක්වෙන්නේ ඔක්තෝම්බර්, නොවැම්බර් මාසවලදී රාත්‍රී 8.00 ට පමණ අහස මුදුනේ දක්නට ලැබෙන තාරකා පංති කීපයකි.

(i) මෙහි **P, Q , R** අක්ෂර වලින් දැක්වෙන තරු පංති 3 නම් කරන්න.

(ii) ඔබ නම්කල තරු පංති 3න් රාශි චක්‍රයට අයත් තරු පංතිය කුමක්ද?

(iii) සීරියස් තරුව පිහිටි තරු පංතිය නම් කරන්න.

(iv) ක්‍රාන්ති වලය යනු කුමක්ද?

(v) දකුණු දිශාව සොයා ගැනීමට ඉහත තරු පංති යොදාගන්නා ආකාරය විස්තර කරන්න.

*(ලකුණු 3×5 = 15)*

03) පහත සඳහන් මාතෘකා තුනක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) ක්ෂුද්‍ර ජීවීන්

(ii) සූර්යග්‍රහණ

(iii) පරිසර දූෂණය

(iv) ද්වි ලෝහක තීරුව

(v) ඵල හා බීජ ව්‍යාප්තිය *(ලකුණු 5×3 = 15)*

04) මෙහි දැක්වෙන්නේ එක්තරා සිසුවෙක් විසින් ද්‍රව්‍ය තුලින් තාප සංක්‍රමණය සොයා බැලීම සඳහා සකස්කරනු ලැබූ ඇටවුමකි.




*II රූපය*

(i) ටික වේලාවක් යන විට ඔහු ලබා ගන්නා නිරීක්ෂණය කුමක්ද?

(ii) එම නිරීක්ෂණයට හේතු පැහැදිලි කරන්න.

(iii) මෙහිදී ඔහු විසින් සොයා බලන තාප සංක්‍රමණ ක්‍රමය හඳුන්වන නම කුමක්ද?

(iv) සූර්යාගේ සිට පෘථිවියට තාපය සංක්‍රමණය වන තාප සංක්‍රමණ ක්‍රමය කුමක්ද?

(v) ජලය තුලින් හා වාතය තුලින් තාපය ගමන්කරන තාප සංක්‍රමණ ක්‍රමය හඳුන්වන නම කුමක්ද?

*(ලකුණු 3×5 = 15)*

05) පහත සඳහන් සිද්ධීන් 03 ක් විද්‍යාත්මකව පහදන්න.

(i) ආහාර ද්‍රව්‍ය වියලි වූ විට ඒවා නරක් වන්නේ නැත.

(ii) රේල් පීලි සවි කිරීමේදී ඒවා සම්බන්ධ කරනු ලබන ස්ථානවල කුඩා පරතරයක් තබනු ලැබේ.

(iii) දුර ස්ථානයක සිදුවන අකුණු ගැසීමකදී ආලෝකය පෙනී ටික වේලාවකට පසු අකුණු හඬ ඇසේ.

(iv) ඇට සහිත දොඩම් බීම වීදුරුවක ලුණු දියකල විට දොඩම් ඇට පාවේ.

(v) තණකොළ පෙත්තා, ගෙම්බා වැනි සතුන් ඔවුන් ජීවත්වන පරිසරයට ගැළපෙන අන්දමට වර්ණ දක්වති.

*(ලකුණු 3×5 = 15)*

06) පහත රූප සටහනේ දක්වා ඇත්තේ පුෂ්පයක දික් කඩකි.




***III*** *රූපය*

(i) මෙම රූපයේ A,B,C,D යන කොටස් නම් කරන්න.

*(ලකුණු 1×5 = 5)*

(ii) එහි පරාග හටගන්නා කොටස කුමක්ද? *(ලකුණු 2)*

(iii) පරාගණයෙන් පසු ඵලයක් බවට පත්වන්නේ එහි කුමන කොටසද?

*(ලකුණු 2)*

(iv) ඵල හා බීජ ව්‍යාප්ත වන ක්‍රම 03ක් නම් කර ඒ සඳහා උදාහරණය බැගින් ලියන්න. *(ලකුණු 6)*

07)

(i) නියං ආපදා කළමණාකරණයේ ප්‍රධාන අවස්ථා තුන නම් කරන්න. *(ලකුණු 3)*

(ii) පූර්ව නියං ආපදා කළමණාකරණය සඳහා අපට ගත යුතු ක්‍රියා මාර්ග හතරක් යෝජනා කරන්න.

*(ලකුණු 4)*

(iii) පශ්චාත් නියං කළමණාකරණයේ අරමුණ අනාගතයේ දී නියං ඇති වීම වළක්වා ගැනීම හා ඒවායේ බලපෑම් අවකම කරගැනීමය. මේ සඳහා ගතයුතු ක්‍රියාමාර්ග හතරක් නම් කරන්න.

*(ලකුණු 4)*

(iv) සුනාමි තත්වයක් පිළිබඳ දැන ගැනීමට ඇති පෙර සළකුණු හතරක් නම් කරන්න. *(ලකුණු 4)*